# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

**සමාජීය විද්‍යා පීඨය**

## ආර්ථිකවිද්‍යාව

**මහා බ්‍රිතාන්‍යයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය - ECON 18224**

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1 කොටස

01. මධ්‍යතන එංගලන්තයේ ක්‍රියාත්මක වූ බණ්ඩාරගම් අර්ථ ක්‍රමයේ ලක්ෂණ පැහැදිලි කර එම අර්ථ ක්‍රමය බිඳවැටීමට තුඩු දුන් සාධක විමසීමට ලක්කරන්න.

02. දුම්රිය ප්‍රවාහන සේවය එංගලන්තයේ කාර්මික හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඉවහල් වූ ආකාරය සාකච්ඡා කරන්න.

03. මහා බ්‍රිතාන්‍යය තුළ කාර්මික විප්ලවයක් ඇතිවීමට පසුබිම් වූ සාධක විස්තර කොට එහි ආර්ථික ප්‍රතිඵල ඇගයීමට ලක්කරන්න.

04. එංගලන්තයේ පළමු හා දෙවන ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයන්හි අරමුණු හඳුන්වා දෙවන ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳව විමසීමක් කරන්න. .

05. එංගලන්තයේ විවිධ යුගයන්හි ඉස්මතු වූ වෘත්තීය සමිතිවල සුවිශේෂී ලක්ෂණ කවරේදැයි සාකච්ඡා කරන්න.

11 කොටස

06. යටත්විජිතකරණය මගින් ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්මාන්තයට සිදු වූ වාසි සහ අවාසි සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ වැඩවසම් ක්‍රමය බිඳවැටීමේ සමාජ ආර්ථික බලපෑම් අගයන්න.

08. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවට කවර බලපෑමක් ඇතිකළේද යන්න සාකච්ඡා කරන්න.

09. ශ්‍රී ලංකාවේ වතු ආර්ථිකය රටේ ආර්ථික සංවර්ධනයට දායක වූ ආකාරය විමසන්න.

10. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතියේ සංවර්ධනයට යටත්විජිතකරණය මගින් වූ බලපෑම් පැහැදිලි කරන්න.

****************************************